පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංකය: **492**

ආයතනයේ නම : දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - මොනරාගල

පාර්ලිමේන්තුවේ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් සභාගත කරන ලද වාර්තා සම්බන්ධයෙන් ස්ථාවර නියෝග අංක 119 (4) යටතේ ගරු අමාත්‍යාවරයාගේ නිරීක්ෂණ හා ගනු ලබන පියවර පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම

பாராளுமன்ற வெளியீட்டுத் தொடர் இலக்கம் : **492**

நிறுவனத்தின் பெயர் : மாவட்ட செயலகம் - மொனராகலை

பாராளுமன்றத்தின் அரச கணக்குக் குழுவினால் முன்வைக்கப்பட்ட அறிக்கை தொடர்பாக நிலையியற் கட்டளை இலக்கம் 119(4) இன் கீழ் கௌரவ அமைச்சரின் அவதானிப்புக்களும் மற்றும் அது தொடர்பாக எடுக்கப்படும் நடவடிக்கைகளும் பாராளுமன்றத்திற்கு சமர்ப்பித்தல்.

**Parliamentary Series No : 492**

**Name of the institution : District Secretariat – Monaragala**

**Submission of observations of the Hon. Minister and steps taken with regard to the reports tabled by the Committee on Public Accounts in terms Standing Orders 119 (4)**

ඇමුණුම 01

**පාර්ලිමේන්තුවේ රජයේ ගිණුම් පිළිබද කාරක සභාව විසින් සභාගත කරන ලද වාර්තා සම්බන්ධයෙන් ස්ථාවර නියෝග 119 (4) යටතේ ගරු අමාත්‍යවරයාගේ නිරීක්ෂණ හා ගනු ලබන පියවර පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම**

---

**පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංක 492**

**දිස්ත්‍රික් ලේකම් කාර්යාලය :- මොනරාගල**

| වාර්තාවෙහි සඳහන් කර ඇති රජයේ ගිණුම් පිළිබද කාරක සභාව විසින් හඳුනාගන්නා ලද අඩුපාඩු | එම අඩුපාඩු වළක්වා ගැනීමට ආයතනය විසින් ගත් ක්‍රියාමාර්ග / වර්තමාන ප්‍රගතිය |
|---|---|
| විගණකාධිපති විසින් ඉදිරිපත් කර තිබූ සෑම විගණන විමසුමක් සඳහා ම මාසයක් ඇතුලත දි පිළිතුරු ඉදිරිපත් නොකිරීම | පිළිතුරු ලබා දීමට කල්ගත වන අවස්ථාවන්වල දී අතුරු පිළිතුරු යැවීමට කටයුතු කර ඇති අතර ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල විගණන විමසුම්වලට අදාළ සියලු නිලධාරීන් කැඳවා විගණන සාකච්ඡාවන් පවත්වා කඩිනමින් පිළිතුරු ලබාගැනීම හා විගණන විමසුම් ලද වහාම කඩිනමින් පිළිතුරු ඉදිරිපත් කිරීම සඳහා නිලධාරීන් දැනුවත් කිරීම ආදි ක්‍රියාමාර්ග ගැනීම තුලින් විගණන විමසුම් සඳහා පිළිතුරු ලබාදීම ප්‍රමාදවීම අවම කර ගැනීමට කටයුතු කර ඇත. |
| අභ්‍යන්තර විගණන විමසුම් සඳහා මාසයක් ඇතුලත දි පිළිතුරු ඉදිරිපත් නොකිරීම | මේ පිළිබඳව ප්‍රාදේශීය විගණන හා කළමනාකරණ කමිටුවල දි අදාල නිලධාරීන් දැනුවත් කර ඇති අතර නිරන්තරව පසුවිපරම් කරමින් පෙළඹවීම් සිදු කරනු ලැබේ.<br>එහිදි විගණන නිරික්ෂණවලට අදාල ගුණාත්මක පිළිතුරක් සකස් කිරිම හා එක් එක් නිරීක්ෂණ පිළිබඳව ක්‍රියාමාර්ග ගත යුතු ආකාරය සාකච්ඡා කරනු ලැබේ.<br>ඉහත ක්‍රියාමාර්ග තුලින් අභ්‍යන්තර විගණන විමසුම් සඳහා පිළිතුරු ලබාදීම ප්‍රමාදවීම අවම කර ගැනිමට හැකි වි ඇත. |
| 2017.06.26 දිනැති අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 7 ඡේදය ප්‍රකාරව 2018 වර්ෂයේදි මිල දී ගන්නා ලද වත්කම් හා අපහරණයන් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රොලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර නොතිබිම | අදාල චක්‍රලේඛය ප්‍රකාරව 2018 වර්ෂයේදි මිල දී ගන්නා ලද වත්කම් හා අපහරණයන් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රොලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර ඇත.<br>2023.08.24 දිනැති අංක 06/2023 වත්කම් චක්‍රලේඛය අනුව අදාල තොරතුරු වාර්තා කර ඇත.<br>කොම්ප්ට්‍රොලර් ජනරාල් කාර්යාලය විසින් වරින් වර ඉල්ලන ලද තොරතුරු නියමිත පරිදි වාර්තා කරනු ලැබේ. |
| වාහනයක් ගර්භිත වී මාස 08ට වඩා අඩු කාලයකදි අපහරණය කර නොතිබිම | ගර්භිත වි තිබුණු වාහන 08 ක් මේ වන විට අපහරණය කර ඇත. අනිකුත් වාහන අපහරණය කිරීම සඳහා කටයුතු සිදු කෙරෙමින් පවති. |

වර්ෂයකට වඩා වැඩි කාලයක සිට පැවත එන හිඟ ණය ශේෂ පැවතීම

- **පළාත් සභා ණය ශේෂ** මේ වන විට අය කර අවසන්ව ඇත.

- **මිය ගිය** එස්.ඩී. කීර්තිසිංහ මහතාගේ ණය ශේෂය ඔහුගේ බිරිඳ විසින් මාසිකව රු.3800.00 බැගින් 2026 පෙබරවාරි මස සිට ගෙවීම් සිදු කරයි.
  **මිය ගිය** ඩී.ඩී.පියදාස මහතාගේ ණය ශේෂය පියවීම සඳහා ඔහුගේ බිරිඳ වෙත කිහිපවරක් ලිපි මඟින් දැනුවත් කර ඇත. ඔහුගේ ඇපකරුවකු වන ඩී.සී.දිසානායක මහතා පිළිබඳ තොරතුරු,මහරගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හරහා ලබා ගැනීමට කටයුතු සිදු කරමින් පවතී.

- **වැඩ තහනම්** ජේ.එම්. හෙට්ටිආරච්චි මහතාට විරුද්ධව අල්ලස් දූෂණ චෝදනාවක් මත වසර දෙකක් නඩු පවරා ඇත.
  **වැඩ තහනම්** වී සිට මේ වන විට මියගොස් ඇති ඒ.එම්.සීලවති මහත්මියගේ ණය ශේෂය පියවීම සඳහා මාසිකව රු.5000.00 බැගින් ගෙවා නිමකිරීමට ඇයගේ උරුමක්කරුවෙකු එකඟ වී ඇත.

- **සේවය අතහැර** ගොස් ඇති ඩබ්.ඒ.කේ.තිලක් මහතා විසින් ණය ගෙවීම පැහැරහැරීම මත ඔහුට විරුද්ධව නඩු පැවරීමට අදාළ ලිපි ලේඛණ රජයේ නීතීඥවරයා වෙත භාර දී ඇත.

- **විශ්‍රාම ගිය** පි.එච්.බී.වික්‍රමසිංහ මහතාගේ ණය ශේෂය හිඟ වැටුප් සහ විශ්‍රාම වැටුප ගෙවීමේදී අය කර ගැනීමට කටයුතු කරමින් පවතී.

**ණය ශේෂ විස්තරය**

| නිලධාරියාගේ නම | 2023.12.31 දිනට ශේෂය | 2026.03.31 දිනට ශේෂය |
|---|---|---|
| **පළාත් සභා** | | |
| යූ.එන්.විජේසිංහ | 113,820.00 | 0 |
| ඩබ්.එම්.ධනපාල | 101,600.00 | 0 |
| **මියගිය** | | |
| ඩී.ඩී. පියදාස | 784,190.40 | 784,190.40 |
| එස්.ඩී. කීර්තිසිංහ | 227,203.20 | 219,603.20 |
| **වැඩතහනම්** | | |
| ඒ.එම්. සීලවති | 201,400.00 | 156,400.00 |
| ජේ.එම්.හෙට්ටිආරච්චි | 162,356.64 | 160,356.64 |
| **සේවය අතහැර ගිය** | | |
| ඩබ්.ඒ.කේ. තිලක් | 230,658.00 | 230,658.00 |
| **විශ්‍රාම ගිය** | | |
| පි.එච්.බී.වික්‍රමසිංහ | 131,600.00 | 131,600.00 |
| **එකතුව** | **1,982,828.24** | **1,682,808.24** |

| | |
|---|---|
| කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ.571 ප්‍රකාරව කටයුතු නොකිරීම | අදාල අංශ දැනුවත් කර නිරවුල් කර ගැනීමට කටයුතු කිරීම හා නිරවුල් කළ නොහැකි තැන්පතු රජයේ ආදායමට බැර කිරීම සිදු කර ඇත. 2023 වර්ෂයේ පැවැති කල් ඉකුත් තැන්පතු සියල්ල මේ වන විට නිරවුල් කර ඇත. |
| මාසිකව දිස්ත්‍රික් සම්බන්ධිකරණ කමිටු රැස්වීම් පවත්වා නොතිබීම | දිස්ත්‍රික් සම්බන්ධිකරණ කමිටු රැස්වීම්, දිස්ත්‍රික්කය නියෝජනය කරනු ලබන පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක්ගේ සභාපතීත්වයෙන් පවත්වනු ලැබේ. එබැවින් රැස්වීම් පවත්වන දින තීරණය කිරීම සභාපතිවරයා විසින් සිදු කරනු ලබන අතර 2023 වර්ෂයේ එවකට සිටි සභාපතිවරයා විසින් තීරණය කරන ලද මාසවල පමණක් දිස්ත්‍රික් සම්බන්ධිකරණ කමිටු රැස්වීම් පවත්වා ඇත.<br>දැනට රාජ්‍ය පරිපාලන පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයේ අංක HA/DEVP/14/DCC/Voll Vlll හා 2025.09.01 දිනැති 03/2025 දිස්ත්‍රික් සම්බන්ධිකරණ කමිටු හා ප්‍රාදේශීය සම්බන්ධිකරණ කමිටු පැවැත්වීම පිළිබඳ වන චක්‍රලේඛය අනුව කටයුතු කරමින් පවතී. |
| දිස්ත්‍රික් නිවාස කමිටුව මාසිකව රැස් වී නොතිබීම | දිස්ත්‍රික් නිවාස කමිටුව පැවැත්වීමේ වගකීම නිවාස සංවර්ධන අධිකාරිය සතුවන අතර නිසි පරිදි නිවාස කමිටුව පැවැත්වීමට කටයුතු සංවිධානය කරන ලෙස නිවාස සංවර්ධන අධිකාරිය දැනුවත් කර ඇත. |
| දිස්ත්‍රික් පොහොර සම්බන්ධිකරණ කමිටුව මාසිකව රැස් වී නොතිබීම | චක්‍රලේඛ උපදෙස් පරිදි මාසික රැස්වීම් පවත්වන ලෙස අදාල නිලධාරීන් දැනුවත් කරන ලදි. 2025 වර්ෂයේ දිස්ත්‍රික් පොහොර සම්බන්ධිකරණ කමිටු 08 ක් පවත්වා ඇත. |
| දිස්ත්‍රික් මිල නියම කිරීමේ කමිටුව මාසිකව රැස් වී නොතිබීම | 2025 වර්ෂයේ දිස්ත්‍රික් මිල නියම කිරීමේ කමිටු 08 ක් පවත්වා ඇත. දැනට රාජ්‍ය පරිපාලන පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයේ අංක HA/DEVP/14/DCC/Voll Vlll හා 2025.09.01 දිනැති 03/2025 චක්‍රලේඛය අනුව කටයුතු කරමි. |
| ආයතනයේ ගිණුම් පිළිබඳ විගණන මතය යටත්ව මට්ටමේ පැවතීම | සුදුසු ක්‍රමවේද භාවිතා කරමින් හා ඵලදායි ලෙස මූල්‍ය කළමනාකරණ පිළිවෙත් භාවිතා කරමින් නිශ්චිත කාල රාමුවක් තුල නියමිත ඉලක්ක සපුරා ගැනීමෙන්, මූල්‍ය ප්‍රකාශන පිළිබඳ පැහැදිලි විගණන මතයක් ලබා ගැනීමට කටයුතු කරන්නෙමු. |
| දිස්ත්‍රික් ඉඩම් පරිහරණ කමිටුව අවම වශයෙන් කාර්තුවකට වරක් රැස් වී නොතිබීම | චක්‍රලේඛ උපදෙස් පරිදි කාර්තුවකට දිස්ත්‍රික් ඉඩම් පරිහරණ කමිටු එක බැගින් පවත්වන ලෙස අදාල නිලධාරීන් දැනුවත් කරන ලද අතර ඒ අනුව අදාල නිලධාරීන්ට සහය ලබාදීම සිදු කරනු ලැබේ. |

ඒ.ජී. නිශාන්ත,
දිස්ත්‍රික් ලේකම් / දිසාපති
දිස්ත්‍රික් ලේකම් කාර්යාලය
මොනරාගල

ජේ.එම්.පී.සිරිවර්ධන,
ප්‍රධාන ගණකාධිකාරී
දිස්ත්‍රික් ලේකම් කාර්යාලය
මොනරාගල

ඒ.ජී. නිශාන්ත
දිස්ත්‍රික් ලේකම්/දිසාපති
මොනරාගල

ජේ.එම්.පී. සිරිවර්ධන
ප්‍රධාන ගණකාධිකාරී
දිස්ත්‍රික් ලේකම් කාර්යාලය
මොනරාගල.